# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. RG/01/එක්දින සේවා

ඔබේ අංකය / உமது இல. / Your No.

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565


දිනය / திகதி / Date 2021.01.21

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 01/2021

සියළුම කලාපභාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

දිස්ත්‍රික්ක භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**ඉඩම් ලියාපදිංචි කිරීමේ සාමාන්‍ය සේවාව යටතේ ලේඛන ලියාපදිංචි කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද අංක 08/2019 දරණ 2019.03.25 දිනැති චක්‍රලේඛයේ ලේඛන ලියාපදිංචි කිරීම යටතේ සඳහන් අංක 01, 02 සහ 03 වගන්ති සහ ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම යටතේ සඳහන් අංක 01, 02 සහ 03 වගන්ති පහත පරිදි සංශෝධනය කරමි.

ලේඛන ලියාපදිංචි කිරීම

01. කණ්ඩායම් A වශයෙන් හඳුනාගන්නා ලද කාර්යාලවල ලියාපදිංචිය සඳහා කඩිනම් සේවා යටතේ ලැබෙන ලේඛන පැය 24ක් තුළදී ලියාපදිංචි කළ යුතු අතර, සාමාන්‍ය සේවා යටතේ ලියාපදිංචිය සඳහා ලැබෙන ලේඛන, භාරදුන් දිනයේ සිට දින 03කට පසුව එළඹෙන දින සිට වැඩ කරන දින 14ක් ඇතුළත පූර්වතාවය අනුවම අත්සන් කර ලියාපදිංචි තැපැලෙන් යැවීම හෝ නිකුත් කිරීම කළ යුතුය.

02. කණ්ඩායම් B වශයෙන් හඳුනාගන්නා ලද කාර්යාලවල ලියාපදිංචිය සඳහා කඩිනම් සේවා යටතේ ලැබෙන ලේඛන පැය 24ක් තුළදී ලියාපදිංචි කළ යුතු අතර, සාමාන්‍ය සේවා යටතේ ලියාපදිංචිය සඳහා ලැබෙන ලේඛන, භාරදුන් දිනයේ සිට දින 03කට පසුව එළඹෙන දින සිට වැඩ කරන දින 07ක් ඇතුළත පූර්වතාවය අනුවම අත්සන් කර ලියාපදිංචි තැපැලෙන් යැවීම හෝ නිකුත් කිරීම කළ යුතුය.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 / 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk / rg@rgd.gov.lk

03. ඇතැම් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල ලියාපදිංචි කරන ලද ලේඛන ආපසු භාරදීමේදී, ඒ සඳහා නිකුත් කළ ලදුපත විමසීමකින් තොරව විවිධ පුද්ගලයන්ට අදාළ ලේඛන නිකුත් කරන බවට තොරතුරු වාර්තා වී ඇත. ලියාපදිංචි කරන ලද ලේඛන නිකුත් කිරීමේදී ලදුපත පරීක්ෂා කර අදාළ ලේඛන නිකුත් කිරීමට කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම

01. කඩිනම් සේවා හා සාමාන්‍ය සේවා යටතේ අයදුම්පත් භාර දීමේදී වෙන වෙනම අයදුම්පත් භාර ගැනීමේ ලේඛන හා කුවිතාන්සි පොත් පවත්වා ගෙන යාම කළ යුතුය.

02. කඩිනම් සේවා අයදුම්පත පෙරවරු 9.00 සිට 12.00 දක්වා භාර ගැනීම සිදුකළ යුතු අතර ඇටෝර්නි බලපත්‍රය පැය 24ක් තුළ ලියාපදිංචි කර නිකුත් කිරීම කළ යුතුය. සේවයේ අවශ්‍යතාවය මත සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය යටතේ පස්වරු 12.00 සිට 3.00 දක්වා ඉල්ලුම් කරන අවස්ථාවේදී පසු දින ලියාපදිංචි කර නිකුත් කිරීම කළ හැකිය.

03. සාමාන්‍ය සේවා යටතේ ලැබෙන ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම වැඩ කරන දින 03 කට පසුව එළඹෙන දින සිට දින 14ක් ඇතුළත ලියාපදිංචි කර තැපැල් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද කරුණු සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් පෞද්ගලිකවම අවධානය යොමු කළ යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

කේ. පී. ධර්මතිලක
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල